055294
ML/PR
2017/09/08

# උඩරට ගිනිමංගල්‍යය ශාන්තිකර්මය සහ වීරමුණ්ඩ දේව සංකල්පය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නර්තන හා නාට්‍ය කලා පීඨයේ පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය මගින් පවත්වනු ලබන ප්‍රාසංගික කලාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධයයි.

055294

DD/MP/DA/09/015

2014

නර්තන හා නාට්‍ය කලා පීඨය
පශ්චාද් උපාධි අධ්‍යයන කේන්ද්‍රය
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

# හැඳින්වීම

විවිධ වූ ස්වාභාවික බලවේග මුල් කර ගෙන මිනිසා විසින් නොයෙක් පුද පූජා අභිචාරයන් හි යෙදුන අතර දේව, යක්ෂ, ප්‍රේත ආදී අමනුෂ්‍ය ගණයා මුල් කොට ගෙන ද විවිධ අභිචාරයන් හි යෙදී ඇත. බුදු සමය ලක්දිවට පැමිණීමෙන් පසුව වුව ද එම ඇදහිලි සම්පූර්ණයෙන් ම මිනිස් සිත තුළින් ඉවත් නොවූ අතර බුදු සමය හා සම්බන්ධ වෙමින් ක්‍රමවත් ලෙස ඒවා හැඩ ගැසුන බව කිව හැකි ය.

විවිධ දෙවිවරුන් ඇදහිල්ලට පාත්‍ර වූ අතර ජනප්‍රවාද සහ පුරාවෘත්ත්ත ගොඩ නගා ගනිමින් යම් යම් විශේෂත්වයන් මුල් කොට ගෙන මෙම දෙවිවරු ජනප්‍රිය වී ඇති බව සඳහන් කළ හැකි ය. මෙසේ විවිධාකාරයෙන් ප්‍රභවය ලත් දෙවි දේවතාවුන් අතර වීරමුණ්ඩ දෙවියන් ද ලක් වැසි ජනතාව අතර පුද පූජාවට පාත්‍ර වූ බව පෙන්වා දිය හැකි ය. බණ්ඩාර යන නාමයෙන් හැඳින්වෙන දේව සමූහයට අයත් මලල බණ්ඩාර හෙවත් වීරමුණ්ඩ දෙවි බෙහෙවින්ම ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ වයඹ සහ මධ්‍යම පළාතේ ය.

ලාංකේය නර්තන සම්ප්‍රදායන් හි ශාන්තිකර්ම ප්‍රධාන වශයෙන් දේව, යක්ෂ සහ ග්‍රහයින් මූලික කරගෙන ශාන්තිකර්ම ගොඩනැගී ඇත. වීරමුණ්ඩ දෙවියන් එහිදී ප්‍රධානව පුද ලබන දෙවි කෙනෙකි. එබැවින් සත් කෝරළය තුළ වඩාත් ප්‍රසිද්ධියට පත් වූ මෙම දෙවියන් ප්‍රධාන කොට ගෙන ශාන්තිකර්මයක් ගොඩනැගී පැවතීම මෙහි දී අප අවධානය යොමු කිරීමට විශේෂ හේතුවක් විය. ඔහු කවුද, කොහේ සිට ආ පුද්ගලයෙක් ද, ජනතාවගෙන් පිදුම් ලැබීමට හේතුව කුමක්ද යනාදී තොරතුරු සත්‍ය වශයෙන් ම දැන ගැනීමට අවශ්‍ය වූ බැවිනි.

ගිනි මංගල්‍යය නමින් ප්‍රාදේශීය ව්‍යවහාරයට පත් ව ඇති මෙම දේව තෝත්‍රය අන් ශාන්තිකර්ම තරම් ප්‍රසිද්ධත්වයක් නො වුව ද ප්‍රදේශයේ ජනතාව අතර වසරකට වරක් අඛණ්ඩව සිදු කෙරෙන එකම ශාන්තිකර්මය මෙය යැයි පැවසීම නිවැරදි ය. වීරමුණ්ඩ දෙවියන් උදෙසා ඉදි වූ දේවාලවල අවුරුද්දේ ඇසළ මාසයේ දී ගිනි මංගල්‍යය උඩරට නර්තන සම්ප්‍රදායානුකූලව උත්සවාකාරයෙන් පවත්වනු ලබයි. මෙය උඩරට නර්තන සම්ප්‍රදාය හා බැඳි ශාස්ත්‍රීය නර්තන අංග ඇතුළත් කොහොඹා යක් කංකාරිය හා බෙහෙවින් සමානතාවයක් දරන්නා වූ ශාන්තිකර්මයකි. එහෙත් මේ තුළ විශේෂතා රාශියක් දැකගත හැකි ය. ශාන්තිකර්ම බෙහෙවින් අභාවයට යමින් පවතින

මොහොතක සහ සමාජයක් තුළ මිනිසුන්ගේ අවධානය මෙවැනි දෑ කෙරෙහි යොමු වන්නේ ද කලාතුරකිනි.

වීරමුණ්ඩ දෙවියන් මුල් කරගත් මෙම සංස්කෘතික අංගය උඩරට ප්‍රදේශයේ මාදුරේ කෝරළය ප්‍රධාන කොටගෙන සහ එම ප්‍රදේශයේ ඉදි වූ වීරමුණ්ඩ දේවාල මුල් කොටගෙන පවත්වනු ලබන්නකි. උඩරට නර්තන සම්ප්‍රදාය පවතින ප්‍රදේශ අතරින් වීරමුණ්ඩ දේවාල අධිකව පිහිටි ප්‍රදේශය ලෙස සහ වැඩිම ගිනි මංගල්‍යය සිදු කරන ප්‍රදේශයක් වශයෙන් මාදුරේ කෝරළය සඳහන් කළ හැකි ය. තත් දෙවියන්ගේ ලංකාගමනය හා සම්බන්ධව පවතින ගිනි පෑගීම එහි ප්‍රධාන අංගයකි. මෙම හේතු කාරණා මත අප පර්යේෂණ කාර්යය මාදුරය කෝරළය ඇසුරෙන් නිම කිරීම සඳහා තෝරා ගතිමි.

සුළු ප්‍රදේශයකට පමණක් සීමා වී පවතින්නා වූ මෙම දේව තෝත්‍රය දිවයිනේ ප්‍රසිද්ධව පවත්නා අන් ශාන්තිකර්මයන් හා සමානව ම සංස්කෘතික අංග රාශියකින් පෝෂණය ලත් වටිනා ජනශ්‍රැතික අංගයක් වශයෙන් හැඳින්විය හැකි ය. එබැවින් ඒ කෙරෙහි අප අවධානය යොමු කිරීමට විශේෂ කාරණයක් විය. වීරමුණ්ඩ දේවාල වැඩි ප්‍රමාණයක් ඉදි වී ඇත්තේ මෙම මාදුරේ කෝරළයෙහි බැවින් එම ප්‍රදේශය සීමා කොට ගෙන අධ්‍යයන කටයුතු සිදු කිරීමට මෙහි දී අප බලාපොරොත්තු වූ බව සඳහන් කළ යුතු ය.

උඩරට නර්තන සම්ප්‍රදාය පවත්නා ප්‍රදේශ මූලික කොටගෙන දේශීය නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වය තුළ ම වීරමුණ්ඩ දෙවියන්ගේ නාමය භාවිත වන බව හඳුනා ගැනීමට පුළුවන. ලෙඩ දුක්, සශ්‍රීකත්වය, පළිගැනීම, මන්ත්‍ර භාවිතය, ගිනි පෑගීම ආදි විවිධ වූ යාතු කර්ම මූලික කර ගෙන මෙම වීරමුණ්ඩ දෙවියන් සම්බන්ධ වී ඇත. එබැවින් ලාංකික ජනතාවගේ සිත් තුළ ගෞරවයට පාත්‍ර වූ මෙම දෙවියන් සහ දේව සංකල්පය පිළිබඳව කරුණු විමසීමක යෙදීමට බලාපොරොත්තු වෙමි. වීරමුණ්ඩ නම් ඔහුගේ මව, පියා, උපන් දේශය, ලංකාවට පැමිණීම, ඔහු කළ දක්ෂකම්, ලංකා ජනතාව තුළ ගෞරවයට සහ දේව වන්දනයට ලක්වීම යනාදී කරුණු පිළිබඳව ගවේෂණයක යෙදීමට ද මෙහි දී අදහස් කරන්නෙමු.